# 2019 ජනවාරි මස 25 වන දිනැති අංක නාහ 5 දරණ නාවික හමුදාධිපතිගේ සංදේශයේ 2 වන ඡේදය " එ" ප්‍රකාරව විශ්‍රාම ගනු ලබන නාවික පුද්ගලයින් සඳහා නාවික විශ්‍රාම වැටුප් අංශයේ පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කලයුතු ලිපි ලේඛන නිවරදිව භාරදීම සඳහා අනුගමනය කල යුතු මාර්ගෝපදේශ සංග්‍රහය

1. නාවික පොදු දි.කා.ස 262013 අගෝස්තු 2019 දරණ සංඥාව ප්‍රකාරව නාවික විශ්‍රාම වැටුප් අංශයේ පැවැත්වෙන නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගනු ලබන නාවික පුද්ගලයින්ගේ සම්මුඛ පරීක්ෂණයේදී, විශ්‍රාමික නාවික පුද්ගලයින් විසින් උක්ත **නාහ 5 සංදේශයේ 2 වන ඡේදය " එ"** ප්‍රකාරව ඉදිරිපත් කලයුතු ලිපි ලේඛන නිවරදිව ඉදිරිපත් නොකරන බවත්, ඒ හේතුවෙන් විශ්‍රාමික නාවික පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සැලකිය යුතු කාලයකින් ප්‍රමාද වන බවත් නිරීක්ෂණය වී ඇත.

2. එබැවින්, මින් ඉදිරියට විශ්‍රාම ගනු ලබන නාවික පුද්ගලයින්ගේ සම්මුඛ පරීක්ෂණයේදී, විශ්‍රාමික නාවික පුද්ගලයින් විසින් උක්ත **නාහ 5 සංදේශයේ 2 වන ඡේදය " එ"** ප්‍රකාරව ඉදිරිපත් කලයුතු ලිපි ලේඛන නිවරදිව ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා පිළිවෙත් සහ උපදෙස් මාලාව අනුගමනය කරන ලෙස දැන්වේ.

අ. **<u>උප්පැන්න සහතික ඉදිරිපත් කිරීම</u>**

(1) පහත සඳහන් පරිදි උප්පැන්න සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කල යුතු අතර, එම උප්පැන්න සහතිකවල සඳහන් තොරතුරු පැහැදිලිව ඒවායේ සඳහන්ව තිබිය යුතුය.කිසියම් හේතුවක් මත උප්පැන්න සහතිකයේ සඳහන් තොරතුරු අපැහැදිලිව බොඳවී ගිය අකුරු සහිතව සඳහන් වී තිබේනම්, ඒ සඳහා පැහැදිලි නව පිටපත් ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

(අ) විශ්‍රාමිකයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත් 02
(ආ) කාලාත්‍රයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත් 02
(ඇ) දරුවන්ගේ උප්පැන්න සහතික වල මුල් පිටපත් 02 බැගින්

(2) ඉහත සඳහන් උප්පැන්න සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කිරීමේදීඑම උප්පැන්න සහතික පහත සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගන්නාලද,අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරයා විසින් රබර් මුද්‍රාවේ අත්සන තබා සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද උප්පැන්න සහතිකපත් විය යුතුය.

## ආ.  ඉදිරිපත් කල යුතු නිවැරදි උප්පැන්න සහතිකයන් සඳහා ආදර්ශ

### විශ්‍රාමිකයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටුව

8953

ලියාපදිංචි කිරීම ආ 64
ப. பதிவு ஆ. 64
Registration B 64
(Sen. Sec. paper 15" × 8½
S., T. & E. Ori. & Dup.) 8/70

ඉල්ලුම්පත් අංකය සහ දිනය / விண்ணப்பத்தின் இலக்கமும் திகதியும் / Application No. and Date: 6081 / 81.06.10

ශ්‍රී ලංකා / இலங்கை / CEYLON

**උප්පැන්න සහතිකය**
**பிறப்பு அத்தாட்சிப் பத்திரம்**
**CERTIFICATE OF BIRTH**

අනුක්‍රමික අංකය / தொடர் இலக்கம் / Serial No.: ඇ N° 961103

අංකය / இல. / No.: 2526

දිස්ත්‍රික්කය / மாவட்டம் / District:

කොට්ඨාශය / பிரிவு / Division: දෙහිවල - ගල්කිස්ස

| | | |
|---|---|---|
| 1. උපන් දිනය හා ස්ථානය / பிறந்த திகதியும் இடமும் / Date and place of birth | | 1981 (අසූඑකේ) ජූනි මස අටවන දින<br>දකුණු කොළඹ මහ රෝහල, කළුබෝවිල |
| 2. නම / பெயர் / Name | | සුරේෂ් පෙරේරා |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය / பால் / Sex | | පුරුෂ |
| 4. පියාගේ / தகப்பன் / Father's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | මහවඩුගේ සිරිලාල් පෙරේරා |
| | උපන් දින / பிறந்த திகதி / date of birth | 1954 - 01-05 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | කුලියාපිටිය |
| | ජාතිය / சாதி / race | සිංහල |
| | තත්ත්වය නොහොත් වෘත්තිය / அந்தஸ்து அல்லது தொழில் / rank or profession | ගුරුවෘත්තිය |
| 5. මවගේ / தாய் / Mother's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | තහදලියනගේ දීපාලිකා පෙරේරා |
| | උපන් දින / பிறந்த திகதி / date of birth | 1963. 01-01 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | රත්මලාන |
| | ජාතිය / சாதி / race | සිංහල |
| | වයස / வயது / age | අවුරුදු දහඅටයි. |
| 6. මව්පියන් විවාහක ද ? / பெற்றோர் விவாகஞ் செய்தவர்களா ? / Were parents married ? | | ඔව් |
| 7. මුත්තා ලංකාවේ උපන්නේ නම් / பாட்டன் இலங்கையிற் பிறந்தால் / If grandfather born in Ceylon | ඔහුගේ සම්පූර්ණ නම / முழுப் பெயர் / his full name | නොදනී. |
| | ඔහු උපන් වර්ෂය / பிறந்த வருஷம் / his year of birth | |
| | ඔහු උපන් ස්ථානය / பிறந்த இடம் / his place of birth | |

ඒ 51359 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

[අනිත් පිට බලන්න/மறுபக்கம் பார்க்கவும்/P.T.O.

## විශ්‍රාමිකයාගේ උප්පැන්න සහතිකයේ පසු පිටුව

| | | |
|---|---|---|
| 8. පියා ලංකාවේ නොඉපිද මුත්තා ලංකාවේ උපන්නේ නම් මුත්තාගේ<br>தகப்பன் இலங்கையிற் பிறக்காமல் பூட்டன் இலங்கையிற் பிறந்தால் அவர்<br>If the father was not born in Ceylon and if great grandfather born in Ceylon, the great grandfather's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | පියා |
| | උපන් වර්ෂය / பிறந்த வருஷம் / year of birth | ලංකාවේ |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | උපන්නෙකි. |
| 9. දැනුම්දුන් තැනැත්තාගේ සම්පූර්ණ නම, වාසස්ථානය හා දැනුම් දුන්නේ කවරෙකු වශයෙන් ද යන්න<br>தகவலாளரின் முழுப் பெயரும் வதியுமிடமும், என்ன முறையில் தகவல் கொடுக்கிறார்<br>Informant's full name, residence, and in what capacity he gives information | | මහවඩුගේ සිරිලාල් පෙරේරා<br>කේ. 11 වී ද්‍රවිඩ නිවාස<br>රත්මලාන<br>පියා |
| 10. දැනුම්දුන් අයගේ අත්සන<br>தகவலாளரின் கையொப்பம்<br>Informant's signature | | අත්: ආර්. ආච්. පෙ. |
| 11. ලියාපදිංචි කළ දිනය<br>பதிவு செய்யும் திகதி<br>Date of registration | | 1981 (අසූ එක) ජූනි මස<br>- දහ වන දින |
| 12. ලේකම්ගේ අත්සන<br>பதிவுகாரர்'ன் கையொப்பம்<br>Registrar's signature | | අත්: පී. කේ. පෙරේරා |
| 13. ලියාපදිංචි කිරීමෙන් පසුව ඇතුළත්කරන ලද නැතහොත් කලින් තිබූ නම වෙනුවට අලුතෙන් යොදන ලද නම<br>பதிவுசெய்தபின் புதிதாகச்சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த பெயர்<br>Name inserted, or substituted, after registration | | ඉල්ලුම්පත් අංකය A/3299 දිනය 2018 : 04 : 18 |
| 14. 13 වෙනි අංකයට ඇතුළත් විස්තර කරුණු සැපයීමට ආරංචි දුන් තැනැත්තාගේ නම සහ එසේ දැනුම් දුන්නේ කවරෙකු වශයෙන්ද යන්න<br>பதின்மூன்றாவது விஷயத்துக்குத் தகவல் கொடுத்தவரின் பெயர்; என்ன முறையில் தகவலைக் கொடுத்தார்<br>Name of person on whose information particulars relating to item 13 were supplied, and in what capacity he gave information | | දත්ත පද්ධතියේ ඇති ... [illegible] ... දිස්ත්‍රික්කයේ<br>45 බ. [illegible] ... කොට්ඨාශයේ ලියාපදිංචි කරන<br>ලද උපත්/මරණ/විවාහ ලේඛනයක සත්‍ය පිටපතක් බව<br>සහතික කරමි. |
| 15. නම ඇතුළත්කිරීමේ හෝ වෙන නමක් යෙදීමේ හෝ දිනය හා දිස්ත්‍රික් ලේකම්ගේ හෝ රිජිස්ත්‍රාර් ජනරාල් තැනගේ අත්සන<br>பெயரைப் புதிதாகச் சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த திகதி; பதிவுகாரியகர்த்தர் அல்லது பெரும் பகுதிப் பதிவுகாரரின் கையொப்பம்<br>Date of insertion, or substitution, and District Registrar's or Registrar-General's signature | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>ගල්ගමුව.<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |

ආර්.එම්. මාලනී රත්නායක මැණිකෙ
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගල්ගමුව

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ගේ අත්සන හා නිල මුද්‍රාව

# විශ්‍රාමිකයාගේ බිරිඳගේ උප්පැන්න සහතිකයේ මුල් පිටුව

ශ් 50202 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා/இலங்கை/SRI LANKA

Registration B 1
(High Reg P. & S. O.)
12/78

**උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛනය**
பிறப்புப் பதிவுப் புத்தகம்
**REGISTER OF BIRTHS**

අංකය / இல. } 5614 ★

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (110 වන පරිච්ඡේදය)
பிறப்புகள் இறப்புகள் பதிவுச் செய் சட்டம் (அத்தியாயம் 110)
*Births and Deaths Registration Act (Cap. 110)*

දිස්ත්‍රික්කය / மாவட்டம் / District } කුරුණෑගල

කොට්ඨාශය / பிரிவு / Division } 45 [illegible] කෝරළේ දකුණ

| | | |
|---|---|---|
| 1. උපන් දිනය හා ස්ථානය [1] / பிறந்த திகதியும் இடமும்[1] / Date and place of birth [1] | | 1981 (අසූඑකේ) මාර්තු දහතුන් වැනි දින<br>දිස්ත්‍රික් රෝහල - ගල්ගමුව |
| 2. නම / பெயர் / Name | | අනෝමා කුමාරි ජයසිංහ |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය / பால் / Sex | | ගෑනු |
| 4. පියාගේ / தகப்பன் / Father's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | ලියනරාලලාගේ ජයසිංහ |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1940 - 12 - 30 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | කඩිඋල්ල |
| | ජාතිය [2] / சாதி[2] / race [2] | සිංහල |
| | තත්ත්වය හෝ වෘත්තිය / அந்தஸ்து அல்லது தொழில் / rank or profession | [illegible] ලිපිකරු |
| 5. මවගේ / தாய் / Mother's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | හේරත් මුදියන්සේලාගේ රෝසලින් |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1941 - 01 - 12 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | ගල්ගමුව |
| | ජාතිය [2] / சாதி[2] / race [2] | සිංහල |
| | වයස / வயது / age | අවුරුදු හතලිහයි |
| 6. මවපියන් විවාහකද ? / பெற்றோர் விவாகஞ் செய்தவர்களா ? / Were parents married ? | | ඔව් |
| 7. මුත්තා උපන්නේ ශ්‍රී ලංකාවේ නම් [3] / பாட்டன் இலங்கையில் பிறந்தால் அவர்[3] / If grandfather born in Sri Lanka[3] | ඔහුගේ සම්පූර්ණ නම / முழுப் பெயர் / his full name | ලියනරාලලාගේ [illegible] |
| | ඔහු උපන් වර්ෂය / பிறந்த வருடம் / his year of birth | නොදනී |
| | ඔහු උපන් ස්ථානය / பிறந்த இடம் / his place of birth | කඩිඋල්ල |

1, 2 සහ 3 පොතේ මුල් කවරයේ යට ඇත්තේ උපදෙස් බලන්න.

[අනික් පිට බලන්න/மறுபக்கம் பார்க்க.

# විශ්‍රාමිකයාගේ බිරිඳගේ උප්පැන්න සහතිකයේ පසු පිටුව

| | | |
|---|---|---|
| 8. පියා ශ්‍රී ලංකාවේ නොඉපිද මීමුත්තා ශ්‍රී ලංකාවේ උපන්නේනම් මීමුත්තාගේ[3]<br>தகப்பன் இலங்கையிற் பிறக்காமற் பூட்டன் இலங்கையிற் பிறந்தால் அவர்[3]<br>If the father was not born in Sri Lanka and if great-grandfather born in Sri Lanka great grandfather's [3] | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | පියා |
| | උපන් වර්ෂය / பிறந்த வருடம் / year of birth | ලංකාවේ |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | [illegible] |
| 9. දැනුම් දෙන්නාගේ සම්පූර්ණ නම, පදිංචි ස්ථානය හා දැනුම්දෙන්නේ කවරෙකු වශයෙන්ද යන්න<br>தகவலாளரின் முழுப்பெயரும் வதிவிடமும், என்ன முறையில் தகவல் கொடுக்கிறார்<br>Informant's full name, residence, and in what capacity he gives information | | [illegible] සෝමසුන්දරම්<br>දිසාත් වෛද්‍ය නිලධාරී<br>ගල්ගමුව |
| 10. දැනුම්දෙන්නාගේ අත්සන<br>தகவலாளரின் கையொப்பம்<br>Informant's signature | | 16 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශය පිට ලියාපදිංචි කරන ලදී. |
| 11. ලියාපදිංචි කරන දිනය[1]<br>பதிவு செய்யும் திகதி[1]<br>Date of registration [1] | | 1981 (අසූඑක) මැයි [illegible] |
| 12. ලේකම්ගේ අත්සන<br>பதிவுகாரரின் கையொப்பம்<br>Registrar's Signature | | [signature] |
| 13. ලියාපදිංචි කිරීමෙන් පසුව ඇතුළත් කරන ලද නැතහොත් කලින් තිබූ නම වෙනුවට අලුතෙන් යොදන ලද නම<br>பதிவு செய்தபின் புதிதாகச் சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த பெயர்<br>Name inserted or substituted after registration | | ඉල්ලුම්පත් අංකය A/3299 දිනය 2018 . 04 . 18 |
| 14. 13 වෙනි අංකයට ඇතුළත් විස්තර කරුණු සැපයීමට ආරංචි දුන් තැනැත්තාගේ නම සහ එසේ දැනුම් දුන්නේ කවරෙකු වශයෙන්ද යන්න<br>பதின்மூன்றாவது விஷயத்துக்குத் தகவல் கொடுத்தவரின் பெயர், என்ன முறையில் தகவலைக் கொடுத்தார்?<br>Name of person on whose information particulars relating to item 13 were supplied and in what capacity he gave information | | දත්ත පද්ධතියේ ඇති කු/ගල දිස්ත්‍රික්කයේ 45. බ. දිඹුල කොට්ඨාශයේ ලියාපදිංචි කරන ලද උපත්/මරණ/විවාහ ලේඛනයක සත්‍ය පිටපතක් බව සහතික කරමි. |
| 15. නම ඇතුළත් කිරීමේ හෝ වෙන නමක් යෙදීමේ හෝ දිනය හා දිස්ත්‍රික් ලේකම්ගේ හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ අත්සන<br>பெயரைப் புதிதாகச் சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த திகதியும் பதிவுகாரியகர்த்தா அல்லது பெரும் பதிவு பதிவுகாரரின் கையொப்பமும்<br>Date of insertion or substitution and District Registrar's or Registrar-General's Signature | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගල්ගමුව.<br>[signature]<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |


1. සජීවී උපන් අනිවාර්යය :- 1
2. මව ගේ සාමාන්‍ය පදිංචිය :- ගල්ගමුව
3. උපත්ලැබූ කොට්ඨාශය :- ගල්ගමුව.

ආර්.එම්. මාලනී රත්නායක මැණිකෙ
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගල්ගමුව

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ගේ අත්සන හා නිල මුද්‍රාව

(අ) උප්පැන්න සහතික ඉදිරිපත් කිරීමේදී පුද්ගලයෙකු ඉපදුන අවස්ථාවේදී අදාල රෝහලේ උප්පැන්න ලියාපදිංචි අංශය මගින් නිකුත් කරන උප්පැන්න සහතිකයේ වම්පස ඉහල කෙලවරේ **<u>'නොමිලයේ නිකුත් කරන ලදී'</u>** ලෙස සටහන් කර ඇති උප්පැන්න සහතිකපත් මේ සඳහා වලංගු නොවේ.

## ඈ. <u>වලංගු භාවයක් නොමැති උප්පැන්න සහතිකයක ආදර්ශය</u>




## ඇ. <u>දරුවන්ගේ උප්පැන්න සහතිකපත් ඉදිරිපත් කිරීමේදී විශේෂයෙන් පරීක්ෂා කර තහවුරු කරගත යුතු කරුණු</u>

(1) දරුවාගේ උප්පැනන් සහතිකයේ **<u>2 වන තීරයේ දරුවාගේ නම</u>** නිවැරදිව සටහන්ව ඇතිද යන්න පරීක්ෂා කර ගත යුතුය.


(2) විශ්‍රාමිකයාගේ නම උප්පැන්න සහතිකයට අනුව සහ ජාතික හැඳුනුම්පතට අනුව දරුවාගේ උප්පැන්න සහතිකයේ **<u>4 වන තීරයේ පියාගේ නම</u>** සඳහන් වන තීරයේ නිවැරදිව සටහන්ව ඇතිද යන්න පරීක්ෂා කර ගත යුතුය.

උදා : නිවැරදි නම : මහවඩුගේ සුරේෂ් පෙරේරා

වැරදියට නම් සටහන් විය හැකි ආකාර : මහ වඩුගේ සුරේස් පෙරේරා

මහ වඩුගේ සුරේෂ් පෙරේරා

## දරුවන්ගේ උප්පැන්න සහතිකයන්




H 040892 – 3,000 (2012/09)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා / இலங்கை / SRI LANKA

Registration B 1

උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛනය
பிறப்புப் பதிவுப் புத்தகம்
REGISTER OF BIRTHS

අංකය / இல. / No.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (110 වන පරිච්ඡේදය)
பிறப்புகள், இறப்புகள் பதிவு செய் சட்டம் (அத்தியாயம் 110)
Births and Deaths Registration Act (Cap. 110)

දිස්ත්‍රික්කය / பெரும் பகுதி / District: ගම්පහ.
කොට්ඨාශය / பிரிவு / Division: ගම්පහ නගරය.

| | | |
|---|---|---|
| 1. උපන් දිනය සහ ස්ථානය[1] / பிறந்த திகதியும் இடமும்[1] / Date and place of birth[1] | | 2013 (දෙදහස් දහතුන) මාර්තු විසිතුන්වෙනිදා දිස්ත්‍රික් මහ රෝහල ගම්පහ |
| 2. නම / பெயர் / Name | | සසඳු මනීෂ පෙරේරා |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය / பால் / Sex | | පුරුෂ |
| 4. පියාගේ / தகப்பன் / Father's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | මහවඩුගේ සුරේෂ් පෙරේරා |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1981 - 6 - 8 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | මහ රෝහල, කළුබෝවිල |
| | ජාතිය[2] / சாதி[2] / race[2] | සිංහල |
| 5. මවගේ / தாய் / Mother's | සම්පූර්ණ නම[1] / முழுப் பெயர்[1] / full name[1] | ලියනගේගේ පුෂ්පා කුමාරි ජයසිංහ |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1981 - 3 - 14 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | දිසා රෝහල, ගම්පහ |
| | ජාතිය[2] / சாதி[2] / race[2] | සිංහල |
| | වයස / வயது / age | අවුරුදු තිස්දෙකයි |
| 6. මව්පියන් විවාහකද ? / பெற்றோர் விவாகஞ் செய்தவர்களா ? / Were parents married ? | | ඔව් |
| 7. මුත්තා උපන්නේ ශ්‍රී ලංකාවේ නම්[3] / பாட்டன் இலங்கையில் பிறந்தால் அவர்[3] / If grandfather born in Sri Lanka[3] | ඔහුගේ සම්පූර්ණ නම / முழுப் பெயர் / his full name | මහවඩුගේ සිරිලාල් පෙරේරා |
| | ඔහු උපන් වර්ෂය / பிறந்த வருடம் / his year of birth | 1954 (දහනමසිය) |
| | ඔහු උපන් ස්ථානය / பிறந்த இடம் / his place of birth | කුලියාපිටිය රෝහල |

ඉතිරි කොටස අනෙක් පිටුවේ / P.T.O

## <u>දරුවන්ගේ උප්පැන්නයේ පසු පිටුව</u>


| | | |
|---|---|---|
| 8. පියා ශ්‍රී ලංකාවේ නොඋපිද මී මුත්තා ශ්‍රී ලංකාවේ උපන්නේ නම් මී මුත්තාගේ [3] தகப்பன் இலங்கையிற் பிறக்காமற் பூட்டன் இலங்கையிற் பிறந்தால் அவர் [3] If the father was not born in Sri Lanka and if great grandfather born in Sri Lanka great-grandfather's[3] | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | [illegible] |
| | උපන් වර්ෂය / பிறந்த வருடம் / year of birth | [illegible] |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | [illegible] |
| 9. දැනුම් දෙන්නාගේ සම්පූර්ණ නම, පදිංචි ස්ථානය හා දැනුම්දෙන්නේ කවරෙකු වශයෙන්ද යන්න தகவலாளரின் முழுப் பெயரும் வதிவிடமும், என்ன முறையில் தகவல் கொடுக்கிறார் Informant's full name, residence and in what capacity he gives information | | මහ වඩුගේ සුරේෂ් පෙරේරා<br>නො. 285/31/4/D, [illegible],<br>යක්කල (පියා) |
| 10. දැනුම්දෙන්නාගේ අත්සන தகவலாளரின் கையொப்பம் Informant's signature | | [signature] |
| 11. ලියාපදිංචි කරන දිනය[1] பதிவு செய்யும் திகதி[1] Date of registration[1] | | 2008 (දෙදහස්අට) දෙසැම්බර් දහතුන්වෙනිදින |
| 12. රෙජිස්ට්‍රාර්ගේ අත්සන பதிவுகாரரின் கையொப்பம் Registrar's signature | | [signature]<br>ඩබ්. ජී. පී. ජේ. අමරසිංහ |
| 13. ලියාපදිංචි කිරීමෙන් පසුව ඇතුළත් කරන ලද නැතහොත් කලින් තිබූ නම වෙනුවට අළුතෙන් යොදන ලද නම பதிவு செய்தபின் புதிதாகச் சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த பெயர் Name inserted or substituted after registration | | ඉල්ලුම්පත් අංකය A/3299 දිනය 2018.04.18 |
| 14. 13 වෙනි අංකයට ඇතුළත් විස්තර කරුණු සැපයීමට ආරංචි දුන් තැනැත්තාගේ නම සහ එසේ දැනුම් දුන්නේ කවරෙකු වශයෙන්ද යන්න பதின்மூன்றாவது விஷயத்துக்குத் தகவல் கொடுத்தவரின் பெயர் என்ன முறையில் தகவலைக் கொடுத்தார் ? Name of person on whose information particulars relating to item 13 were supplied and in what capacity he gave information | | දත්ත පද්ධතියේ ඇති කෑ/ගල දිස්ත්‍රික්කයේ 45 B. [illegible] කොට්ඨාශයේ ලියාපදිංචි කරන |
| 15. නම ඇතුළත් කිරීමේ හෝ වෙන නමක් යෙදීමේ හෝ දිනය හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ අත්සන பெயரைப் புதிதாகச் சேர்த்த அல்லது பதிலாகக் கொடுத்த திகதியும் பதிவு காரியகர்த்தா அல்லது பெரும் பகுதிப் பதிவுகாரரின் கையொப்பமும் Date of insertion or substitution and District Registrar's or Registrar General's signature | | ලද උපත්/මරණ/විවාහ ලේඛනයක සත්‍ය පිටපතක් බව සහතික කරමි.<br>[signature]<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගල්ගමුව.<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |

ආර්.එම්. මාලනී රත්නායක මැණිකෙ
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගල්ගමුව

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ගේ අත්සන හා නිල මුද්‍රාව

**ඉ.	<u>ඉහත සඳහන් කල උදාහරණය අනුව දරුවාගේ උප්පැන්නයේ පියාගේ නමෙහි වෙනසසඳහා සකස් කල යුතු වන දිවුරුම් ප්‍රකාශය</u>**

**<u>ආදර්ශය 1</u>**



<u>දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 285/31/4/D කිරිකිත්තමුල්ල, යක්කල යන ලිපිනයෙහි පදිංචි ........ මහවඩුගේ සුරේෂ් පෙරේරා ........ වන මම, බෞද්ධාගමිකාරයෙකු/ කතෝලික භක්තිකයකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක ................ දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසය.

ඇ. අංක ................ දරණ මාගේ ජාතික හැඳුනුම්පතේ නම සඳහන් වන්නේ ................................................ ලෙසය.

ඈ. අංක ................ දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසවය.

ඉ. අංක 5155 ........ දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ ........ මහ වඩුගේ සුරේෂ් පෙරේරා ........ ලෙසය.

ඊ. අංක 0076 ........ දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ ........ මහවඩුගේ සුරේෂ් පෙරේරා ........ ලෙසය.

උ. අංක ................ දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසය.

ඌ. අංක ................ දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම දහන් වන්නේ ................................................ ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසවය.

ඒ. අංක ................ දරණ ගිණුමෙහි මාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසය.

ඉහත සඳහන් නම් සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිහිප දෙනකු නොව ........ මහවඩුගේ සුරේෂ් පෙරේරා ........ වන මා පමණක් බව ප්‍රතිඥා දි ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසි!

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී
වර්ෂ ................ ක් වූ ................ මස .......... වෙනි දින .................... අත්සන් කරන ලදී.

රු.50
මුද්දරය
ප්‍රතිඥාකරු

සාමවිනිසුරුතැන

රු. 50.00 ක මුද්දරයක් ඇලවිය යුතුයි

(1)	විශ්‍රාමිකයාගේ බිරිඳගේ නම උප්පැන්න සහතිකයට සහ ජාතික හැඳුනුම්පතට අනුව නිවැරදිව දරුවාගේ උප්පැනන් සහතිකයේ **<u>5 වන තීරයේ මවගේ නම</u>** සඳහන් වන තීරයේ සටහන්ව ඇතිද යන්න පරීක්ෂා කර ගත යුතුය.

උදා : නිවැරදි නම :ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ

වැරදියට නම් සටහන් විය හැකි ආකාරයන් } : <u>ලියන රාළලාගේ</u> අනෝමා කුමාර ජයසිංහ
<u>ලියනරාලලාගේ</u> අනෝ්මා කුමාරි ජයසිංහ

# දරුවාගේ උප්පැන්නයේ මවගේ නම සඳහන් වන ආකාරය

H 040892 – 3,000 (2012/09)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා / இலங்கை / SRI LANKA

Registration B 1

උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛනය
பிறப்புப் பதிவுப் புத்தகம்
REGISTER OF BIRTHS

අංකය / இல. / No.

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (110 වන පරිච්ඡේදය)
பிறப்புகள், இறப்புகள் பதிவு செய் சட்டம் (அத்தியாயம் 110)
*Births and Deaths Registration Act (Cap. 110)*

දිස්ත්‍රික්කය / பெரும் பகுதி / District: ගම්පහ.

කොට්ඨාසය / பிரிவு / Division: ගම්පහ නගරය.

| | | |
|---|---|---|
| 1. උපන් දිනය හා ස්ථානය[1] / பிறந்த திகதியும் இடமும்[1] / Date and place of birth[1] | | 2013 (දෙදහස් දහතුන) මාර්තු විසිතුන්වෙනිදා දිස්ත්‍රික් මහ රෝහල ගම්පහ |
| 2. නම / பெயர் / Name | | සසඳ මනීෂ පෙරේරා |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය / பால் / Sex | | පුරුෂ |
| 4. පියාගේ / தகப்பன் / Father's | සම්පූර්ණ නම / முழுப் பெயர் / full name | මහවඩුගේ සුරේෂ් පෙරේරා |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1981 – 6 – 8 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | මහ රෝහල, කළුබෝවිල |
| | ජාතිය[2] / சாதி[2] / race[2] | සිංහල |
| 5. මවගේ / தாய் / Mother's | සම්පූර්ණ නම[1] / முழுப் பெயர் / full name[1] | ලියනරාළලාගේ අනෝමා කුමාරි ජයසිංහ |
| | උපන් දිනය / பிறந்த திகதி / date of birth | 1981 – 3 – 14 |
| | උපන් ස්ථානය / பிறந்த இடம் / place of birth | දිසා රෝහල, ගල්ගමුව |
| | ජාතිය[2] / சாதி[2] / race[2] | සිංහල |
| | වයස / வயது / age | අවුරුදු තිස්දෙකයි |
| 6. මව්පියන් විවාහකද ? / பெற்றோர் விவாகஞ் செய்தவர்களா ? / Were parents married ? | | ඔව් |
| 7. මුත්තා උපන්නේ ශ්‍රී ලංකාවේ නම්[3] / பாட்டன் இலங்கையிற் பிறந்தால் அவர்[3] / If grandfather born in Sri Lanka[3] | ඔහුගේ සම්පූර්ණ නම / முழுப் பெயர் / his full name | මහවඩුගේ සිරිලාල් පෙරේරා |
| | ඔහු උපන් වර්ෂය / பிறந்த வருடம் / his year of birth | 1954 (ආසන්නව) |
| | ඔහු උපන් ස්ථානය / பிறந்த இடம் / his place of birth | කුලියාපිටිය රෝහල |

P.T.O

5 වන තීරයේ
මවගේ නිවැරදි නම

5 වන තීරයේ මවගේ නම වැරදියට
සටහන් විය හැකි අකාරය
ලියන රාළලාගේ අනෝමා කුමාරි

**ඊ. <u>ඉහත සඳහන් කල උදාහරණය අනුව දරුවාගේ උප්පැන්නයේ මවගේ නමෙහි වෙනස සඳහා සකස් කල යුතු වන දිවුරුම් ප්‍රකාශය</u>**

**<u>ආදර්ශය 2</u>**

<u>දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 285/31/4/B, [illegible] - (දකුණ), [illegible] යන ලිපිනයෙහි පදිංචි ලියනාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ වන මම, කතෝලික භක්තිකයෙකු /බෞද්ධාගමිකාරයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක ................දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ ................................ ................................................................ ලෙසය.

ඇ. අංක.............................දරණ මාගේ ජාතික හැඳුනුම්පතේ නම සඳහන් වන්නේ................................................................ ලෙසය.

ඈ. අංක ......................... දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ................................ ................................................................ලෙසටය

ඉ. අංක 5155 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ ලියනාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ........... ලෙසය.

ඊ. අංක 0076 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ ලියනාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ....... ලෙසය.

උ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ................................................................ ලෙසය.

ඌ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම දහන් වන්නේ................................................................ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ ................................................ ................................................................ලෙසටය.

ඉහත සඳහන් නම් සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිහිප දෙනකු නොව ලියනාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ................ වන මා පමණක් බව ප්‍රතිඥා දි ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසී!

| |
|---|
| රු.50<br>මුද්දරය<br><br>ප්‍රතිඥාකරු |

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී

වර්ෂ ................ ක් වූ ............... මස .......... වෙනි දින .................... අත්සන් කරන ලදි.

සාමවිනිසුරු/කැන

රු. 50.00 ක මුද්දරයක් ඇලවිය යුතුයි

## උ. ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම

- විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පතෙහි අංශභාර නිලධාරි විසින් සහතික කරන ලද ජායාස්ථිත පිටපත් 02
- කාලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතෙහි අංශභාර නිලධාරි විසින් සහතික කරන ලද ජායාස්ථිත පිටපත් 02


(1) සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට පෙර විශ්‍රාමිකයාගේ සහ කාලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත් නිසි පරිදි පරීක්ෂාකර එහි සඳහන් තොරතුරු නිවරදි නොවන පහත සඳහන් අවස්ථාවන්හිදී නව හැඳුනුම්පතක් ලබාගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

(අ) උප්පැන්න සහතිකයට අනුව තම නම, ජාතික හැඳුනුම්පතෙහි නිවැරදිව සටහන්ව ඇතිද යන්න පරීක්ෂා කර ගත යුතු අතර,එසේ නොමැති නම් ඒ සඳහා නව හැඳුනුම්පතක් ලබාගත යුතුය.


(ආ) උප්පැන්න සහතිකයට අනුව තම නම සහ පෙලපත් නාමය ජාතික හැඳුනුම්පතෙහි නිවැරදිව සටහන්ව නොමැති නම් ඒ සඳහා නව හැඳුනුම්පතක් ලබා ගත යුතුය.

(ඇ) තම ජාතික හැඳුනුම්පතේ නම සහ අංකය පැහැදිලිව නොමැති නම් (බොඳවී හෝ දුර්වර්ණ වී ඇති විටදී) ඒ සඳහා නව හැඳුනුම්පතක් ලබා ගත යුතුය.

### විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත



**<u>විශ්‍රාමිකයාගේ බිරිදගේ ජාතික හැඳුනුම්පත</u>**




(2) විශ්‍රාම යන නාවික පුද්ගලයා නාවික හමුදාවේදී ඔහුගේ නම උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි නිවැරදිව භාවිතා කර ඇත්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඔහුගේ නාවික හමුදා හැඳුනුම්පත පරීක්ෂා කලයුතු වේ. කිසියම් ලෙසකින් විශ්‍රාම යන නාවික පුද්ගලයා නාවික හමුදාවේදී ඔහුගේ නම උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි නිවැරදිව භාවිතා කර නොමැති නම් සම්මුඛ පරීක්ෂණයට ප්‍රථම උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ නම අධ්‍යක්ෂ නාවික පුද්ගල අංශයේ අදාල ලිපි ලේඛණ වල සහ මානව දත්ත කලමනාකරණ පද්ධතියතුල නිසි මඟින් නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතුය.

ඍ. **<u>නාවික හමුදාවේදී නිවැරදිව නම භාවිතා කර ඇත්ද යන්න පරීක්ෂා කර ගත යුතු ආකාරය.</u>**




උදා-: ජාතික හැඳුනුම්පතට අනුව නම : මහවඩුගේ සුරේෂ් පෙරේරා

උප්පැන්න සහතිකයට අනුව නම : මහවඩුගේ සුරේෂ් පෙරේරා

උදා-: 1නාවික හමුදාවේ වැරදියට භාවිතා කරන ලද නම:**<u>මහ වඩුගේ සුරේෂ් පෙරේරා</u>**

(1) උදා-:1 දී ඉහත සඳහන් පුද්ගලයාගේ නම නාවික හමුදා ලිපි ලේඛණ වල **<u>මහවඩුගේ</u>** යන පෙලපත් නාමය එක වචනයක් ලෙස සඳහන් නොකර **<u>මහ</u>** සහ **<u>වඩුගේ</u>** ලෙස නම සඳහන් කිරීම සිදුවී ඇති අතර, එලෙස සඳහන් කර ඇති නම නිවැරදි නොවන බව දැන්වේ.

උදා-:21නාවික හමුදාවේ වැරදියට භාවිතා කරන ලද නම: **<u>එම්.ඩබ්ලිව්.එස්. පෙරේරා</u>**

(2) උදා-:2 දී ඉහත සඳහන් පුද්ගලයාගේ **<u>මහවඩුගේ</u>** යන පෙලපත් නාමය නාවික හමුදා ලිපි ලේඛණ වල **<u>මුලකුරු</u>** මගින් සඳහන් කර ඇති අතර,එලෙස මහවඩුගේ ලෙස නම සඳහන් නොකිරීම නිවැරදි නොවන බව දැන්වේ.


එ. **<u>විවාහ සහතිකය ඉදිරිපත් කිරීම</u>**

**<u>සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට පෙර විවාහ සහතිකය පරීක්ෂා කරගත යුතු ආකාරය</u>**


(1) විවාහ සහතිකයේ විවාහක දිනය පැහැදිලිව ඇත්දැයි පරීක්ෂා කර බැලිය යුතු අතර එම දිනය සමඟ නාවික හමුදාවේ ලිපි ලේඛණවල මෙන්ම විශ්‍රාම වැටුප් ආකෘතිපත්‍රය (අංක 01) හි අනු අංක 10 යටතේ වන විවාහක දිනය සන්සන්දනය කර එම සියලු දිනයන් එක සමානද යන්න පරීක්ෂාකර ගත යුතුය. එසේ නොමැති නම් විවාහ සහතිකයේ සඳහන් නිවැරදි දිනය විශ්‍රාම වැටුප් ආකෘතිපත්‍රය (අංක 01) හි අනු අංක 10 යටතේ සඳහන් කල යුතුය.

(2) ඉහත සඳහන් විවාහ සහතිකයේ මුල් පිටපත් ලබාගැනීමේදී එම විවාහ සහතිකය පහත සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගන්නා ලද අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින්රබර් මුද්‍රාවේ අත්සන තබා සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද විවාහ සහතිකයක් විය යුතුය.

## විශ්‍රාමිකයාගේ විවාහ සහතිකයේ මුල් පිටුව





## විශ්‍රාමිකයාගේවිවාහ සහතිකයේ පසු පිටුව




(3) විවාහ සහතිකය ඉදිරිපත් කිරීමේදී විවාහ වන අවස්ථාවේදී අදාල විවාහ රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන විවාහසහතිකයේ වම්පස උඩ කෙලවරේ ‘**නොමිලයේ නිකුත් කරන ලදී**’ලෙස සටහන් ඇති විවාහ සහතිකපත් මේ සඳහා වලංගු නොවේ.

වලංගු නොමැති විවාහ සහතිකය



විවාහ ලේකම් පොත

REGISTER OF MARRIAGES

Marriage Registration Ordinance (Cap. 112)

Issued Free of Charge

Registration B

No. 023

| | Male Party | Female Party |
|---|---|---|
| 1. Names (in full) of Parties | මහවඩුගේ සුරේෂ් පෙරේරා | ලියන ගාලගේ අශෝකා කුමාරි විජයසිංහ |
| 2. Age (in years) | | |
| 3. Civil Condition | අවිවාහක | අවිවාහක |
| 4. Rank or Profession and Race | | |
| 5. Residence | අංක 285/31/4 B | අංක 47/3/A |
| 6. Father's Name (in full) | මහවඩුගේ | ලියන ගාලගේ විජයසිංහ |
| 7. Rank or Profession of Father | | |
| 8. Name and Division of Registrar who issued Certificate | | |
| 9. Place of Solemnization of Marriage | | |

Solemnized by me (or in my presence) this ... day of ... 20

This Marriage was solemnized between us in the presence of

Signature of Witness

Name in full, Rank or Profession and Residence of Witness

Signed before me.

Registrar (or) Minister (as the case may be)

* I certify that the above is a true copy of the Statement No. ... furnished to me under Section 34, Marriage Registration Ordinance (Cap. 112) ; of a Marriage Solemnized by (or in the presence of) ... Minister

Date of entry in District Registrar's Register

District Registrar

* To be filled-up only when entering a Marriage Solemnized by a Minister.

(4) විශ්‍රාමිකයාගේ සහ බිරිඳගේ නම් උප්පැන්න සහතිකයට අනුව නිවැරදිව විවාහ සහතිකයේ සටහන්ව ඇතිද යන්න පරීක්‍ෂා කර යුතුය. එසේ නිවැරදිව නම සඳහන් නොවන පහත සඳහන් අවස්ථාවන්හිදී නම්වල පවතින වෙනස්කම් සඳහා පහත ආදර්ශ 3ට අනුව සකස් කරනලද දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

**උදා-:** ජාතික හැඳුනුම්පතට සහ උප්පැන්න සහතිකයට අනුව විවාහ සහතිකයේ සඳහන් විය යුතු නිවැරදි නම : **මහවඩුගේ සුරේෂ් පෙරේරා**

**ඉහත සඳහන් නම පහත සඳහන් ලෙස මහවඩුගේ යන නම කොටස් දෙකකට විවාහ සහතිකයේ සඳහන් වී තිබිය හැක.**

**මහ වඩුගේ සුරේෂ් පෙරේරා**

ඒ. **<u>විශ්‍රාමිකයාගේ විවාහ සහතිකයේ නම්වල පවතින වෙනස්කම් සඳහා දිවුරුම් ප්‍රකාශය</u>**

<u>ආදර්ශය 3</u>

<u>දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 285/31/4/D හිරිස්සාගල්ල (දකුණ) යන ලිපිනයෙහි පදිංචි මහවඩුගේ සුරේෂ් පෙරේරා වන මම, බෞද්ධාගමිකාරයෙකු/ කතෝලික භක්තිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක ................ දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ .................................................................................................... ලෙසය.

ඇ. අංක .................... දරණ මාගේ ජාතික හැඳුනුම්පතේ නම සඳහන් වන්නේ.................................................................................................... ලෙසය.

ඈ. අංක 023 දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ මහ වඩුගේ සුරේෂ් පෙරේරා .................................................................................................... ලෙසටය.

ඉ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ.................................................................................................... ලෙසය.

ඊ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ.................................................................................................... ලෙසය.

උ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ.................................................................................................... ලෙසය.

ඌ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම දහන් වන්නේ.................................................................................................... ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ.................................................................................................... ලෙසටය.

ඒ. අංක ...................... දරණ ගිණුමෙහි මාගේ නම සඳහන් වන්නේ .................................................................................................... ලෙසය.

ඉහත සඳහන් නම සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිසිප දෙනකු නොව ..........එම්. වඩුගේ සුරේෂ් පෙරේරා.......... වන මා පමණක් බව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසී!

| |
|---|
| රු.50 |
| මුද්දරය |
| ප්‍රතිඥාකරු |

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී

වර්ෂ ................ ක් වූ ............... මස
.......... වෙනි දින ...................
අත්සන් කරන ලදි.

සාමවිනිසුරුතැන

උදා-: ජාතික හැඳුනුම්පතට සහ උප්පැන්න සහතිකයට අනුව විවාහ සහතිකයේ සඳහන් විය යුතු බිරිඳගේ නිවැරදි නම : **ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ**

**ඉහත සඳහන් ලියනරාලලාගේ යන නම පහත සඳහන් ලෙස කොටස් දෙකකට විවාහ සහතිකයේ සඳහන් වී තිබිය හැක.**

**ලියන රාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ**

**ඔ. <u>විශ්‍රාමිකයාගේ විවාහ සහතිකයේ බිරිඳගේ නමෙහි පවතින වෙනස්කම් සඳහා දිවුරුම් ප්‍රකාශය</u>**

**<u>ආදර්ශය4</u>**

<u>දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 285/31/4/D, කිරිකිත්තුල්ල (දකුණ) පත්කලි ................ යන ලිපිනයෙහි පදිංචි විශාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ................ වන මම, කතෝලික භක්තිකයෙකු /බෞද්ධාගම්කාරයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක ................දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ ................................................ ලෙසය.

ඇ. අංක................................දරණ මාගේ ජාතික හැඳුනුම්පතේ නම සඳහන් වන්නේ................................................ ලෙසය.

ඈ. අංක 023 දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ විශා රාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ................ලෙසටය

ඉ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ................................................ ලෙසය.

ඊ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ................................................ ලෙසය.

උ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම සඳහන් වන්නේ................................................ ලෙසය.

ඌ. අංක ............... දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තීරයේ මවගේ නම දහන් වන්නේ................................................ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ ................................................ ................................................ලෙසටය.

ඉහත සඳහන් නම් සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිහිප දෙනකු නොව විශාරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ................ වන මා පමණක් බව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසි!

| |
|---|
| රු.50 |
| මුද්දර |
| ප්‍රතිඥාකරු |

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී

වර්ෂ ................ ක් වූ ............... මස .......... වෙනි දින ...................
අත්සන් කරන ලදි.

සාමවිනිසුරුතැන

ඕ. <u>**බැංකු පොතේ පිටපත් ඉදිරිපත් කිරීම.**</u> **බැංකු පොතේ පිටපත් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුයි.**

(1) ඔබ විසින් විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ගිණුම තනි පුද්ගල ගිණුමක් විය යුතුය.

(2) රජයේ බැංකුවක ගිණුමක් විය යුතුය. (ලංකා බැංකුව, මහජන බැංකුව හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව)

(3) බැංකු ගිණුමේ අංකය සහ නම පැහැදිලිව තිබිය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකයද නිවැරදිව සටහන්ව තිබිය යුතුය.

(4) ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නිවරදි නම බැංකු ගිණුමේද නිවැරදිව සටහන් වී තිබිය යුතුය.


**උදා : නිවැරදි නම** **:**MAHAWADUGE SURESH PERERA

**වැරදියට නම සටහන් විය හැකි ආකාර**
**:**MAHA WADUGE SURES PERERA
**:**MAHAVADUGASURES PERERA

(5) පවතින බැංකු ගිණුමේ පාස් පොත ඉහත සඳහන් පරිදි නිවැරදි නොවන්නේ නම් ඉහත සඳහන් පරිදි සකස් කර ගන්නා ලද බැංකු ගිණුම් පාස් පොතක් අළුතින් ලබාගත යුතුයි.

(6) ඉහත සඳහන් තොරතුරු නිවැරදිව පවතීනම් පහත සඳහන් පරිදි එම බැංකු පොතේ පිටපත් 02 ක් අංශභාර නිලධාරී විසින් සහතික කර ඉදිරිපත් කල යුතුය.

<u>බැංකු පොතේ පිටපත ඉදිරිපත් කිරීම</u>




ක. <u>ග්‍රාම නිලධාරී සහතිකය සහ එහි පිටපත ඉදිරිපත් කිරීම</u>

(1) මෙහිදී ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකයේ ඔබගේ නම සහ ලිපිනය නිවැරදිව තිබිය යුතුය.

(2) ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකය මාස හයක් ඇතුලත ලබාගත් සහතිකයක් විය යුතු අතර, එහිග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අත්සන් සමඟනිල මුද්‍රා තබා තිබීම අනිවාර්ය වේ.

(3) **එමෙන්ම ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකය අවම වශයෙන් කල් ඉකුත් වීමේ දිනයට (මාස 06 ඉකුත්වීමට) පෙර මාස තුනක කාලයක් තිබියදී විශ්‍රාම වැටුප් අංශයට භාරදීමට කටයුතු කලයුතුය.**



S/1 984928

ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය

Certificate on residence and character issued by the Grama Niladhari

This certificate issued by the Grama Niladhari of the Division in which the applicant resides is valid only for 06 months from the date countersigned by the Divisional Secretary.

| | | |
|---|---|---|
| (1) (a) | District and Divisional Secretary's Division | ගම්පහ - ගම්පහ |
| (b) | Grama Niladhari Division and Number | 309/ ඒ කිරිකිත්තමුල්ල (දකුණ) |
| (c) | Whether applicant is personally known to the Grama Niladhari ? | ඔව් |
| (d) | If so, since when | 2014/07/01 සිට |
| (2) | Information about Applicant | |
| (a) | Name and Address | මහවඩුගේ සුරේෂ් පෙරේරා<br>285/31/4/ ඩී කිරිකිත්තමුල්ල යක්කල |
| (b) | Sex | පුරුෂ |
| (c) | Age | අවු: 42 යි |
| | Civil Status | විවාහක |
| (d) | Whether Sri Lankan | ඔව් |
| | Religion | බෞද්ධ |
| (e) | Present Occupation | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| (f) | Period of residence in the village | අවු: 27 ක සිට |
| I | National Identity Card No. | 198116004216 |
| II | Number of the Electoral Register and Particulars of Registration | 2018 වර්ෂයේ ඡන්ද නාම ලේඛනයේ 359 යටතේ ... |
| (g) | Name and Address of the father | S. D. ... |
| (h) | Purpose for which the certificate is required | නාවික හමුදා විශ්‍රාම වැටුප ... ඉදිරිපත් කිරීමට |
| (i) | Usual Signature / Thumb Impression | [signature] |

# ග්‍රාම නිලධාරී සහතිකයේ පසු පිට

(3) වෙනත් විස්තර | வேறு விபரங்கள் | Other Information

(අ) ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පදිංචිව සිටි කාලය
(அ) கிராம உத்தியோகத்தர் பிரிவில் வசித்த காலம்
(a) Period of residence in the Grama Niladhari Division | ඉ/උ:- 27 ක සිට

(ආ) පදිංචිව සිටි කාලය ඔප්පු කිරීම සඳහා වෙනත් සාක්ෂිවල ස්වභාවය
(ஆ) வதிவுக் காலத்தை நிரூபிப்பதற்காக உள்ள மற்றைய சான்றுகளின் தன்மை
(b) Nature of other evidences in proof of the period of residence | ———

(ඇ) ඉල්ලුම්කරු/කාරිය උසාවියකින් වරදකරු කර තිබේද?
(இ) விண்ணப்பதாரர் நீதிமன்றமொன்றினால் குற்றவாளியாக்கப்பட்டுள்ளாரா?
(c) Whether the Applicant has been convicted by a Court of Law ? | වාර්තා වී නැත

(ඈ) පොදු වැඩ, සමාජ සේවා වැඩ ආදිය සම්බන්ධයෙන් ඔහු/ඇය උනන්දුවක් දක්වා තිබේද ?
(ஈ) பொது வேலைகள்/ சமூக சேவைகள் என்பவற்றில் அவர் ஆர்வம் காட்டியுள்ளாரா?
(d) Whether he/she has taken an interest in public activities social service work, Community Work etc. ? | ඔව්

(ඉ) ඔහුගේ/ඇයගේ චරිතය
(உ) அவரின் குணநலம்
(e) His/her charcter | හොඳයි

(4) වෙනත් කරුණු
வேறு விடயங்கள்
Remarks

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත් ඉල්ලුම්කරු/කාරිය ලියාපදිංචි කිරීමෙන්/පරම්පරාවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බව ඔහුගේ/ඇයගේ ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අංකය ................ බවත් එය ................................ විසින් නිකුත් කර ඇති බව මෙයින් සහතික කරමි.

மேற்போந்த விடயங்கள் நான் அறிந்த அளவில் சரியானவையென்றும் விண்ணப்பதாரர் பதிவுசெய்யப்பட்ட/ பரம்பரை வழியில் இலங்கை பிரசை என்றும் அவர் பதிவு செய்யப்பட்ட சான்றிதழின் இலக்கம் ................ என்றும் அது ................ ஆல் வழங்கப்பட்டுள்ளதென்றும் இத்தால் உறுதிப்படுத்துகிறேன்.

It is hereby certified that the above particulars are correct to the best of my knowledge, he/she is a citizen of Sri Lanka by descent/registration, his/her Certificate of Registration Number is ................ and that it has been issued by ...............

එම්.ඒ.ඩී.ආර්. සී. පෙරේරා
ග්‍රාම නිලධාරී
235 බී, ... උතුර
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගම්පහ දිස්ත්‍රික්කය.

ග්‍රාම නිලධාරීගේ අත්සන සහ නිල මුද්‍රාව

ග්‍රාම නිලධාරීගේ අත්සන සහ මුද්‍රාව
கிராம உத்தியோகத்தரின் கையொப்பமும் அலுவலக முத்திரையும்.
Signature of Grama Niladhari and Official Stamp

දිනය
திகதி
Date | 2019/11/25

අනු අත්සන
மேலொப்பம்
Counter Signature

කේ.ඒ.ආර්. උපේක්ෂා ... 
... ප්‍රාදේශීය ලේකම්
ගම්පහ ප්‍රාදේශීය ලේකම් වෙනුවට

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

ප්‍රාදේශීය ලේකම්
பிரதேசச் செயலாளர்
Divisional Secretary

දිනය
திகதி
Date | 2019.11.25

H 053022 – 10,000 (2019/05)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ග. <u>**දිව්රුම් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම**</u>

(1) **ඉහත සඳහන් කරන ලද දිවුරුම් ප්‍රකාශ ආදර්ශ 1 සිට ආදර්ශ 4 දක්වා පෙන්වා ඇත්තේ එක්එක් අවස්ථාවන් වල නම් වල පැවති අදාල වරද නිවැරදි කර ගත යුතු ආකාරය පැහැදිලිව පෙන්වා දීම සඳහා සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශ බව දන්වන අතර, එම ආදර්ශයන්ගේ සඳහන් ආකාරයටම නොවුවද වෙනත් නොයෙක් ආකාරයන්ට අදාල සහතික වල ඔබගේ සහ කාලාත්‍රයාගේ නම සඳහන් වී ඇති ආකාරය හෝ නම සඳහන් කර ඇති අකුරු වෙනස්ව සඳහන් වන සෑම අවස්ථාවකදීම ඔබ විසින් පහත සඳහන් ආකාරයට සකස් කරන ලද දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු අතර එය සකස්කර ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කල යුතුය.**

(අ) ඉහත සඳහන් කරන ලද දිවුරුම් ප්‍රකාශ ආදර්ශ 1 සිට ආදර්ශ 4 දක්වා පෙන්වා දී ඇති උප්පැන්න සහතික වල, ජාතික හැදුනුම්පත් වල, විවාහ සහතිකයේ සහ බැංකු ගිණුමේ නම් වල වෙනස්කම් පවතින අවස්ථාවලදී**(පහත උදාහරණයේ සඳහන් පරිදි)** විශ්‍රාමිකයාගේ ඉහත සියළු ලේඛණයන්හි නම් වල වෙනස්කම් සඳහා එක් දිවුරුම් ප්‍රකාශයක් පහත සඳහන් ආදර්ශ 5 හි සඳහන් පරිදි සකස් කර රුපියල් 50 ක් වටිනා මුද්දරයක් අලවා මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාර වරයෙකු විසින් අත්සන් යොදා සහතික කිරීමෙන් පසු එම දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත් 02 සහ එහි ඡායා පිටපතක් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

**උදා:** රාජපක්ෂ-රාජපක්‍ෂ, චන්ද්‍රසිරි-චන්‍ද්‍රසිරි, ප්‍රියන්ත-ප්‍රියංක, ප්‍රියදර්ශණ-ප්‍රියදර්සන ශාන්ත-සාන්ත, ඇපා-ඇපා, ප්‍රේමදාස-පේමදාස, ධර්මසිරි-දර්මසිරි

<u>ආදර්ශය 5</u>



<u>දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 285/31/4/D නිරිකත්ත මුල්ල (දකුණ), ... යන ලිපිනයෙහි පදිංචි මහවඩුගේ සුරේෂ් පෙරේරා වන මම, බෞද්ධාගමිකාරයෙකු/ කතෝලික භක්තිකයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක 2526 දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ සුරේෂ් පෙරේරා. ලෙසය.

ඇ. අංක 198116004216I දරණ මාගේ ජාතික හැදුනුම්පතේ නම සඳහන් වන්නේ මහවඩුගේ සුරේෂ් පෙරේරා. ලෙසය.

ඈ. අංක 023 දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ මහ වඩුගේ සුරේෂ් පෙරේරා ලෙසටය.

ඉ. අංක 5155 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ මහ වඩුගේ සුරේෂ් පෙරේරා ලෙසය.

ඊ. අංක 0076 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ මහවඩුගේ සුරේෂ් පෙරේරා. ලෙසය.

උ. අංක — දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම සඳහන් වන්නේ ........ ලෙසය.

ඌ. අංක — දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 4 වන තීරයේ පියාගේ නම දහන් වන්නේ ........ ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ මහවඩුගේ සුරේෂ් පෙරේරා ලෙසටය.

ඒ. අංක 256-2001-8-7987349 දරණ ගිණුමෙහි මාගේ නම සඳහන් වන්නේ මහවඩුගේ සුරේෂ් පෙරේරා ලෙසය.

ඉහත සඳහන් නම සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිහිප දෙනකු නොව මහවඩුගේ සුරේෂ් පෙරේරා. වන මා පමණක් බව ප්‍රතිඥා දි ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසී!

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී

වර්ෂ ............ ක් වූ ............ මස ........ වෙනි දින ............ අත්සන් කරන ලදි.


සාමවිනිසුරුකැතා

50.00

දේශමාන්‍ය වාසක ආරියරත්න
BA, MA, PG DipMgt(DS), Dip in Edu.
ලුතිනන් - ශ්‍රී ලංකා නාවික ...
සාමදාන විනිශ්චයකාර (මුළු ...)
323/B/1, සියබලාගොඩ, ...
ලි: පා: අංකය: 17-10-මප-මුද-087

(ආ) ඉහත සඳහන් කරන ලද දිවුරුම් ප්‍රකාශ ආදර්ශ 1 සිට ආදර්ශ 4 දක්වා පෙන්වා දී ඇති උප්පැන්න සහතික වල, ජාතික හැඳුනුම්පත් වල සහ විවාහ සහතිකයේ නම් වල වෙනස්කම් පවතින අවස්ථාවලදී විශ්‍රාමිකයාගේ බිරිඳගේ ඉහත සියළු ලේඛණයන්හි නම් වල වෙනස්කම් සඳහා **එක් දිවුරුම් ප්‍රකාශයක්** පහත ආදර්ශ 6 හි සඳහන් පරිදි සකස් කර **රුපියල් 50 ක් වටිනා මුද්දරයක් අලවා මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාර වරයෙකු විසින් අත්සන් යොදා** සහතික කිරීමෙන් පසු එම දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත් 01 ක් සහ එහි ඡායා පිටපතක් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

**ආදර්ශය 6**



දිවුරුම් ප්‍රකාශය/ප්‍රතිඥා ප්‍රකාශය

ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක. 285/31/4/D, ........ යන ලිපිනයෙහි පදිංචි ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ........ වන මම, කතෝලික භක්තිකයෙකු /බෞද්ධාගම්කාරයෙකු වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, සත්‍ය ලෙස ද දිවුරා/ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් ප්‍රකාශ කර සිටිමි.

අ. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

ආ. අංක 5614 දරණ උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසය.

ඇ. අංක 198157400106 දරණ මාගේ ජාතික හැඳුනුම්පතේ නම සඳහන් වන්නේ ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසය.

ඈ. අංක 023 දරණ විවාහ සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසටය

ඉ. අංක 5155 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තිරයේ මවුගේ නම සඳහන් වන්නේ ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසය.

ඊ. අංක 0076 දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5වන තිරයේ මවගේ නම සඳහන් වන්නේ ලියනරාලලා ගේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසය.

උ. අංක – දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තිරයේ මවගේ නම සඳහන් වන්නේ – ලෙසය.

ඌ. අංක – දරණ මාගේ දරුවාගේ උප්පැන්න සහතිකයේ 5 වන තිරයේ මවගේ නම දහන් වන්නේ – ලෙසය.
(දරුවන් සිටින ප්‍රමාණය අනුව සඳහන් කරන්න)

එ. නාවික හමුදා ලිපිලේඛණ වල මාගේ නම සඳහන් වන්නේ ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ ලෙසටය.

ඉහත සඳහන් නම් සියල්ලන්ගෙන්ම හැඳින්වෙන්නේ කිහිප දෙනකු නොව ලියනරාලලාගේ අනෝමා කුමාරි ජයසිංහ වන මා පමණක් බව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

මෙයට
විශ්වාසී!

50.00

ඉහත ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශක හට කියවා තේරුම් කර දීමෙන් පසු සත්‍ය බවට පිළිගෙන දිවුරා/ ප්‍රතිඥා දී මා ඉදිරිපිටදී

වර්ෂ ............... ක් වූ ............... මස .......... වෙනි දින .................. අත්සන් කරන ලදී.

සාමවිනිසුරු/ඇත

BA, MA, PG DipMgt(DS)
323/B/1,
17-10-

(ඇ) ඉහත දිවුරුම් ප්‍රකාශය ඔබ විසින් සම්පූර්ණ කිරීමේදී පලමුව ජාතික හැඳුනුම්පතට අනුව ඔබගේ සම්පූර්ණ නම සඳහන් කල යුතුය. ඉන් පසු දිවුරුම් ප්‍රකාශයේ 'ආ'සිට'ඒ' දක්වා ඇති හිස්තැන් හි අදාල වන පරිදි උප්පැන්න සහතික වල, ජාතික හැඳුනුම්පත් වල, විවාහ සහතිකයේ සහ බැංකු ගිණුමේ නම් වල සඳහන් ඔබගේ නම ඒවායේ සඳහන් ආකාරයෙන්ම සඳහන් කිරීමට වගබලාගත යුතුය.


**3. <u>විශ්‍රාම යාමට අවශ්‍ය සහතිකපත් භාරදීමේදී ඉහත සඳහන් පොදු කරුණු වලට අමතරව ඇතැම් විශ්‍රාමිකයන් හට අදාල විය හැකි විශේෂ අවස්ථා සහ එම අවස්ථාවන්හිදී අනුගමනය කල යුතු ක්‍රියා පිලිවෙත්</u>**

අ. **<u>විශ්‍රාමිකයාගේ දරුවකු අබාධිතව සිටියදී</u>**

(1) ඉහත සඳහන් අවස්ථාවකදී විශ්‍රාමිකයා විසින් පහත සඳහන් උපදෙස් පිලිපැදිය යුතුය.

ඔබගේ දරුවා අබාධිත තත්වයේ පසුවන බවට ඔබ දරුවාගේ රෝග විනිශ්චය සඳහා ඉදිරිපත් කරන ලද වෛද්‍යවරයා වෙත ගොස් සෞඛ්‍ය 307 නැමති පෞද්ගලික වෛද්‍ය සහතිකය ඔබ විසින් ලබාගෙන එහි මුල් පිටපත සහ ඡායා පිටපත් 02ක ඉදිරිපත් කල යුතුය.

**<u>සෞඛ්‍ය 307 - නැමති පෞද්ගලික වෛද්‍ය සහතිකයක ආදර්ශ ආකෘති පත</u>**



පෞද්ගලික වෛද්‍ය සහතිකය
தனிப்பட்ட மருத்துவ சான்றிதழ்
Private Medical Certificate

සෞඛ්‍ය / சுகாதாரம் / Health } 307
Foil & C'foil (S.&E)5/75

G 502909

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
சுகாதார சேவைகள் திணைக்களம்
DEPARTMENT OF HEALTH SERVICES

දිනය / திகதி / Date } 11/5/2019

රජයේ රෝහල அரசாங்க மருத்துவமனை GOVERNMENT HOSPITAL ........

1. රෝගියාගේ නම / நோயாளரின் பெயர் / Name of Patient } ........
2. පදිංචි ස්ථානයේ ලිපිනය / வழமையான வதிவிட முகவரி / Usual address of Residence } ........
3. සේවය කරන්නේ / பணிபுரியும் இடம் / Where employed } Sri Lanka Navy
4. වෛද්‍ය නිලධාරියා නිරීක්ෂණය කළ ලකුණු සහ රෝග ලක්ෂණ / Signs and symptoms observed by Medical Officer } Left side hearing impairment - Noticed at 7yrs age
5. වෛද්‍ය නිලධාරියාගේ අදහස / Medical Officer's Opinion } 1. Left side profound sensory neural hearing impairment. Rt Normal hearing
6. වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශ / Medical Officers recommendations
(අ) ඉල්ලුම්කරු සේවයට සුදුසු ද? / (a) Is applicant fit for duty? } ........
(ආ) නැතිනම්, සේවයට නොපැමිණ සිටීම නිර්දේශ කරන කාල සීමාව / (b) If not, period of absence from duty recommended ........

Clinic no 6338/13
(ENT-LRH)


වෛද්‍ය නිලධාරියාගේ අත්සන / மருத்துவ அதிகாரியின் கையொப்பம் / Signature of Medical Officer.

නම / பெயர் / Name }
තනතුර / பதவி நிலை / Rank

H 044809 – 5,000 (2014/09)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

( 2 ) ඔබගේ දරුවා අබාධිත තත්වයේ පසුවන බවට ඔබ දරුවාගේ රෝග විනිශ්චය සඳහා ඉදිරිපත් කරන ලද වෛද්‍යවරයා විසින් රෝගී තත්වය පිළිබඳ තබන ලද සටහන් හා ඒ සඳහා නිකුත් කරන ලද ප්‍රතිකාර සටහන් ඇතුලත් වෛද්‍ය වාර්ථා හෝ අදාල රෝගී තත්වයන් සටහන් කරන ලද පොතක් ඇතිනම් එහි ඡායා පිටපත් 03ක්ඔබ විසින් ඉදිරිපත් කල යුතුය. **(ඉහත සහතිකපත් නොමැති අවස්ථා වලදීඅදාල රෝගය සඳහා ගත් ප්‍රතිකාර සඳහන් කරන ලද අභ්‍යාස පොතක්පවතී නම් එහි වෛද්‍ය වරයාගේ අත්සන හා නිල මුද්‍රව සහිත පිටපත් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.)**

**<u>වෛද්‍ය සහතිකයක ආකෘතිපත් හා වෛද්‍ය සටහන් සඳහා ආදර්ශ පිටපත්</u>**


6338/13
GN-T

සෞඛ්‍ය } 48
Health
(රෝග පාට පත
8" x 9" සි. ඉ.)63/2

කොළඹ ළමා රෝහල
CHILDREN'S HOSPITAL, COLOMBO

නම } Name } ..........
ඇ.ඉ.වා. අංකය } B. H. T. No. } 31503/14
වාට්ටුව } Ward } 12
ස්ත්‍රී පුරුෂ භාවය } Sex } F

ඇතුළුවූ දිනය } Date of Admission } 30/5/2014
පිටවූ දිනය } Date of Discharge } 31/5/2014
වයස } Age } 9y

රෝග විනිශ්චය } Diagnosis } MRI Brain

කරන ලද පරීක්ෂණ හා කරන ලද ප්‍රතිකාර } Investigations and Treatment given } pt with L) S.N.D

Alv in 7/52

නියම කළ ප්‍රතිකාර } Treatment Advised } ..........

..........
වෛද්‍ය නිලධාරී තැන හෝ ශල්‍ය වෛද්‍ය නිලධාරී තැන.
*Physician or Surgeon.*


දිනය } Date } ..........

ළදරුවා දොස්තර මහතෙකු ලඟට හෝ ආරෝග්‍යශාලාවකට ගෙනගිය විට මෙම සටහන්පත පෙන්වන්න.
பிள்ளையை டாக்டரிடம் அல்லது ஆஸ்பத்திரிக்குக் கொண்டுபோகும்போது இத் துண்டைக் காட்டவும்.
Please show this Card whenever the child is taken to a Doctor, Clinic or Hospital.


[අතික් පිට/ P.T.O.

(3) තවද, ඔබ විසින් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් විශ්‍රාම යාමට නියමිත ඔබ නිවසේ අබාධිත දරුවකු සිටින බවට සහතික කර ලිපියක් ලබාගත යුතු අතර එය ප්‍රාදේශිය ලේකම්ගේ අත්සන සහිතව මුල් පිටපතක් සහ ඡායා පිටපත් 02 විශ්‍රාම වැටුප් අංශය වෙත ලබාදිය යුතුය. **(මෙම ලිපියේ අබාධිත දරුවාගේ නම ලිපිනය සහ ඔබගේ නම ඇතුලත්වීම අනිවාර්ය වේ. )**

**<u>පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙතින් සහතික කර ලබාගත යුතු ලිපියේ ආදර්ශය</u>**



(4) **<u>අබාධිත දරුවාගේ සම්පූර්ණ රූපය සහිත පෝස්ට් කාඩ් ප්‍රමාණයේ වර්ණ ඡායා රූප 02 ක් ඔබ විසින් ඉදිරිපත් කල යුතුය.</u>**




(5) ඉහත ලිපි ලේඛණ වලට අමතරව ඔබට දාව අබාධිත දරුවකු සිටින බවට සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් රු. 50 ක මුද්දරයක් අලවා ඔබේ අත්සන යොදා පදිංචි ප්‍රදේශයේ සාමදාන විනිශ්චකාර වරයකුගේ අත්සන සහිත මුල් පිටපතක් සහ ඡායා පිටපත් 02 සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.**(මෙම දිවුරුම් ප්‍රකාශයේ අබාධිත දරුවාගේ නම ලිපිනය සහ ඔබගේ නම ඇතුලත්වීම අනිවාර්ය වේ. )**

ආ. <u>විශ්‍රාමික ඔබ පෙර විවාහයෙන් දික්කසාද වී සිටින අවස්ථාවකදී</u>

(1) පෙර විවාහයෙන් නීත්‍යානුකූලව වෙන්වී සිටී නම් ඒ සම්බන්ධයෙන් අධිකරණය වෙතින් නිකුත් කරන ලද සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද නෛසයි තීන්දු හා නියත තීන්දු ප්‍රකාශයේ මුල් පිටපත් 02 ක් සහ ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.

(2) එසේම ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විටත් දික්කසාද නඩුවේ උසාවි තීන්දුව ලැබී නොමැති අවස්ථාවන්හිදී ඔබ විසින් ඔබගේ බිරිඳගේ උප්පැන්න සහතිකය ජාතික හැඳුනුම්පත් පිටපත් 02ක් සහ විවාහ සහතිකය ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

(3) තවද, ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විටත් දික්කසාද නඩුවේ උසාවි තීන්දුව ලැබී නොමැතිනම් ඒ අවස්ථාවේදී අදාල නඩුව පවතින බවට නඩු වාර්ථාවක් එම අධිකරණය මඟින් ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු අතර විශ්‍රාම යාමේදී ඉදිරිපත් කල යුතු බිරිඳගේ ලිපි ලේඛන ඇයගෙන් ලබා ගැනීමට හැකියාවක් නොමැතිනම් ඒ බව සඳහන් කර දිවුරුම් ප්‍රකාශයක් රු. 50 ක මුද්දරයක් අලවා ඔබේ අත්සන යොදා පදිංචි ප්‍රදේශයේ සාමදාන විනිශ්චකාර වරයකුගේ අත්සන සහිත මුල් පිටපතක් 02ක් සහ ඡායා පිටපතක් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

ඇ. <u>**ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විට ඔබ විසින් ණය මුදල් ලබාගෙන තිබේ නම්, එහිදී කටයුතු කල යුතු ආකාරය**</u>

(1) ඔබ විසින් විශ්‍රාම යාමට පෙර කිසියම් රජයේ බැංකුවකින් ණය මුදලක් ලබාගෙන එම ණය මුදලේ වාරික මුදල් ඔබගේ මාසික වැටුපෙන් අය කර අදාල බැංකුව වෙත නිරවුල් කලේ නම් ඔබගේ විශ්‍රාම වැටුප බැරවිය යුතු ගිණුම ලෙස ඉහත අනු අංක "ඕ" පරිදි ලබා දිය යුතු බැංකු ගිණුම විය යුත්තේ ඔබ ණය මුදල ලබාගත් බැංකුව වේ. එසේ වුවද,ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විට එම ණය මුදල සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත්නම් ඒ බව සඳහන් කර අදාල බැංකුවෙන් ලිපියක් ලබාගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

**සැ:යු:** ඉහත ඡේදයට අනුව ඔබ විසින් ලබාගන්නා ලද ණය මුදල් සම්බන්ධව විස්තර නාවික හමුදා වැටුප් කාර්යාලයේ පවතින බැංකු අංශය සමඟ සම්බන්ධීකරණය වී දු.ක අංක 13358 හෝ 13370 අමතා ලබා ගැනීමට කටයුතු කල යුතුවේ.

(2) ඔබ නාවික හමුදා සුභසාධක අංශය මගින් ලබා දුන් ඉපලෝගම රණජය පුර නිවාස යෝජනා ක්‍රමයෙන් වාරික ගෙවීමේ පදනම මත නිවසක් ලබාගෙන ඇත්නම් සහ ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විටත් එම නිවාස ණය නිරවුල් නොවී පවතින්නේ නම් ඔබගේ විශ්‍රාම වැටුප බැරවිය යුතු ගිණුම ලෙස ඉහත අනු අංක "ඕ" පරිදි ලබා දිය යුතු බැංකු ගිණුම විය යුත්තේ ඉපලෝගම රණජය පුර ලංකා බැංකු ශාඛවේම ගිණුම වේ.

(3) ඔබ නාවික හමුදාවේ සේවය කරන අවස්ථාවේදී රණවිරු ණය යෝජනා ක්‍රමය යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබාදෙන ලද ණය මුදලලබාගෙන ඇත්නම් සහ ඔබ විශ්‍රාම යන අවස්ථාව වන විටත් එම ණය මුදල නිරවුල් නොවී පවතින්නේ නම් ඔබගේ විශ්‍රාම වැටුප බැරවිය යුතු ගිණුම ලෙස ඉහත අනු අංක ''ඕ'' පරිදි ලබා දිය යුතු බැංකු ගිණුම විය යුත්තේ ඔබ ණය මුදල ලබාගත් ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛාවේම ගිණුම වේ.

(4) තවද, ඔබ විශ්‍රාම ගනු ලබන අවස්ථාව වන විට ඉපලෝගම රණජය පුර නිවාස යෝජනා ක්‍රමයෙන් වාරික ගෙවීමේ පදනම මත නිවසක් සහ රණවිරු ණය යෝජනා ක්‍රමය යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබාදෙන ලද ණය මුදලයන දෙකම ලබාගෙන ඇත්නම්, එම අවස්ථාවේදී ඔබ විසින් පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කල යුත්තේ කුංචිකලම ග්‍රාම නිලධාරී වසමට අයත් ග්‍රාම නිලධාරී සහතිකය වන අතර, ඔබගේ විශ්‍රාම වැටුප බැරවිය යුතු ගිණුම ලෙස ඉහත අනු අංක ''ඕ'' පරිදි ලබා දිය යුතු බැංකු ගිණුම විය යුත්තේ ඔබ ණය මුදල ලබාගත් ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛාවේම ගිණුම වේ.